# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2097/19 – 2018 නොවැම්බර් 14 වැනි බදාදා – 2018.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1889/37 හා 2014.11.21 වැනි දින දරන *රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2014 අංක 332 හා 2014.11.17 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස් අතරින් මෙහි පහත විස්තර වන ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1889/37 හා 2014.11.21 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2014 අංක 332 හා 2014.11.17 වැනි දින දරන ආඥාව මෙම නියමය මඟින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/12/2014/යූඩීජ්/110.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කො/ප්‍රාලේ/ඉඅත්/3/85/යූඩීජ්.
2018 ඔක්තෝබර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටුව (කොට්ඨාස අංක 20 - කොටුව කොළඹ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/සීඕඑල්/2014/528 හා 2014.09.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – ජනාධිපති මාවතේ වරි. අංක 33, 33ඒ, 35, 35/1/1 සහ 37 දරන ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0734 ක් පමණ**

උතුරට: ජනාධිපති මාවත සහ ජනාධිපති මාවතේ වරි. අංක 54 දරන ඉඩම; නැගෙනහිරට: ජනාධිපති මාවතේ වරි. අංක 54 දරන ඉඩම සහ රෝහල මාවත; දකුණට සහ බටහිරට: ජනාධිපති මාවතේ වරි. අංක 41/9 දරන ඉඩම සහ ජනාධිපති මාවත.

11 – 1240



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*